# ඊළමට එරෙහි ඇමරිකානු අභියෝගය

පෙන්සිල්වේනියාවේ ප්‍රකට කතෝලික ලිබරල් අධ්‍යාපන ආයතනයක් වන මර්සිහර්ස්ට් විද්‍යාලයේ ඉතිහාස අධ්‍යයන අංශයට අනුබද්ධව ''පර්යේෂණ සහ බුද්ධි තොරතුරු විශ්ලේෂක වැඩසටහන'' *(Research/Intelligence Analyst Program - RIAP)* ආරම්භ කරන ලද්දේ 1992දී ය. ඇමරිකාවේ ඒ තාක් කල් රාජ්‍ය ඒකාධිකාරය යටතේ පැවැති බුද්ධි තොරතුරු අධ්‍යයන ක්ෂේත්‍රයට සම්බන්ධව, රාජ්‍ය නොවන ආයතනයක් විසින් ආරම්භ කළ එවැනි ගණයේ පළමු අධ්‍යයන පාඨමාලාව සේ එය සැළකේ. 2001 සැප්තැම්බරයේ නිව්යෝක් නුවර ලෝක වෙළඳ මධ්‍යස්ථානයට එල්ල වූ ප්‍රහාරයත් සමගම ඇමරිකානු ඔත්තු සේවා ඒජන්සි තුළ බුද්ධි තොරතුරු විශ්ලේෂණය සම්බන්ධයෙන් ඉහළ නිපුණතාවන්ගේ අවශ්‍යතාව අලුතින් ඉස්මතුව ආවේය. එතෙක් කල් මර්සිහර්ස්ට් විද්‍යාලයේ ඉතිහාස අංශයට අනුබද්ධව තිබූ කලින් කී ''පර්යේෂණ සහ බුද්ධි තොරතුරු විශ්ලේෂක වැඩසටහන'', රාජ්‍ය ප්‍රතිපාදන යටතේ 2004 වසරේ පටන් 'බුද්ධි තොරතුරු අධ්‍යයනය සඳහා වූ මර්සිහර්ස්ට් ආයතනය' *(Mercyhurst College Institute for Intelligence Studies - MCIIS)* වශයෙන් වෙන් වූ අධ්‍යයන පීඨයක් බවට පත් වූයේ මේ නව අවශ්‍යතාව හේතුවෙනි. බුද්ධි තොරතුරු විශ්ලේෂණයට අදාළව ව්‍යවහාරික බුද්ධි කටයුතු *(Applied Intelligence)* පිළිබඳ විද්‍යාපති උපාධියක් පිරිනමන ලොව පළමු රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනය එයයි. ඇමරිකානු හමුදාවේත්, මධ්‍යම රහස් ඔත්තු සේවාවේත්, ෆෙඩරල් විමර්ෂණ බියුරෝවේත් සේවය කොට විශ්‍රාම ලත් ආරක්ෂක විශේෂඥ පිරිස් එහි අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් වශයෙන් ක්‍රියා කරති.

2008 පෙබරවාරියේදී, ඉහත කී මර්සිහර්ස්ට් විද්‍යාලයීය බුද්ධි තොරතුරු අධ්‍යයන ආයතනයේ පාඨමාලා ප්‍රධානී ජේම්ස් බ්‍රෙකන්රිජ් සහ එහි සහාය මහාචාර්ය ඩේවි ග්‍රබෙල්ස්කි ලංකාවට පැමිණියේය. වැඩි ප්‍රසිද්ධියකින් තොරව සිදු වූ එම සංචාරය සම්බන්ධීකරණය කරන ලද්දේ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව විසිනි. රාජ්‍ය දෙපාර්තමේන්තුවට අනුබද්ධ ත්‍රස්ත විරෝධී සහායක කාර්යාංශයේ *(Office of Antiterrorism Assistance - ATA)* අනුග්‍රහයෙන් කළුතර රජයේ පොලිස් අභ්‍යාස විද්‍යාලයේදී තෝරාගත් නිලධාරීන් 22කුගේ කණ්ඩායමක් ඉලක්ක කොටගෙන ත්‍රස්ත මර්දන ක්‍රියා සහ බුද්ධි තොරතුරු විෂයට අදාළ අධ්‍යයන පාඨමාලාවක් සති දෙකක් තිස්සේ පැවත්විණ. මේ පාඨමාලාව වනාහී ආසියා, අප්‍රිකා සහ ලතින් ඇමරිකානු මහාද්වීපවලින් තෝරාගත් රටවල රාජ්‍ය ආරක්ෂක සේවාවන්ගේ බුද්ධි තොරතුරු විශ්ලේෂණය සහ ත්‍රස්ත මර්දන හැකියාවන් වර්ධනය කිරීම පිණිස ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව සහ මර්සිහර්ස්ට් විද්‍යාලයීය බුද්ධි තොරතුරු අධ්‍යයන පීඨය අතර ඇති කරගත් කොන්ත්‍රාත් ගිවිසුමක ප්‍රතිඵලයකි. මේ යටතේ ඉහතින් කී ත්‍රෛමහාද්වීපික කලාපයන් තුළ ක්‍රියාත්මක වූ පළමු ප්‍රායෝගික පාඨමාලා වැඩසටහන ආරම්භ වූයේම ශ්‍රී ලංකාවෙනි.

2007 ජනවාරි මාසයේ අවසාන සතියේ ගාල්ලේ ලයිට්හවුස් හෝටලයේ පුරා දෙදිනක් තිස්සේ පැවැති ශ්‍රී ලංකා සංවර්ධන සංසදයේ *(Sri Lanka Development Forum)* රැස්වීම අමතා කතා කළ කොළඹ ඇමරිකානු තානාපති රොබට් ඕ. බ්ලේක් මෙසේ කීවේය : ''***අපි, (එනම් ඇමරිකා එක්සත් ජනපදය) එල්.ටී.ටී.ඊ. සංවිධානයට ලැබෙන අවි ආයුධ සහ මුදල් ආධාර නවතාලීමට කටයුතු කිරීම මගින්ද, ශ්‍රී ලංකා හමුදාවන්ට සිය ආරක්ෂාව සඳහා අවශ්‍ය පුහුණුවීම් සහ යුද උපකරණ ලබාදීම මගින්ද ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීමට ශ්‍රී ලංකාවට සහාය වන ශක්තිමත් ආධාරකරුවන් වෙමු.***'' රොබට් බ්ලේක්ගේ මේ ප්‍රකාශය වනාහී හරියටම ඊට අවුරුද්දකට කලින් 2006 ජනවාරියේදී කොළඹ ඇමරිකානු වාණිජ මණ්ඩල නියෝජිතයින් අමතා ඔහුගේ පූර්වගාමිකයා වූ ජෙෆ්රි ලුනස්ටඩ් විසින් දෙන ලද පොරොන්දුවම පුනරුච්ඡාරණය කිරීමකි. ත්‍රස්ත මර්දනය සහ බුද්ධි තොරතුරු විශ්ලේෂණය පිළිබඳ මර්සිහර්ස්ට් විද්‍යාලයීය විශේෂඥයින්ගේ දායකත්වය ඒ පොරොන්දුව අකුරටම ඉටුකිරීම ගැන තවත් එක් උදාහරණයක් පමණි.

### අපි වෙනුවෙන් අපි විතරද?

නමුත් නිශ්චිත සාක්ෂි සහිත මේ පැහැදිලි ඇත්ත, දකුණේ බොහෝ දේශපාලන බලවේග විසින් කවර හෝ හේතුවක් නිසා වසන් කිරීමට උත්සාහ කරති: බටහිර බලවේග ශ්‍රී ලංකා රජයේ යුදමය ක්‍රියාමාර්ගයන්ට පුළුවන් තරම් බාධා කරන බව පුන පුනා පවසති. ආසන්නම නිදසුනක් වශයෙන් සැප්තැම්බර් 28 වෙනිදා 'සිළුමිණ' පත්‍රයේ පළ වූ ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශගේ සම්මුඛ සාකච්ඡාව සළකා බලමු. ඔහු මෙසේ කියයි:

> *''අද අන්තර්ජාතිකය ගත්තොත් ප්‍රධාන ප්‍රවණතා කීපයක් මතුවෙලා තියෙනවා. එකක්...සම සභාපති හමුව. මේ අය අවුරුදු ගාණක් තිස්සේ හම්බවෙන්නේ නැතුව ඉඳලා දැන් හදිසියේ හම්බවෙන්න පටන් ගත්තා. මේ හමුවීමට ඒ අය පොළඹවන්නේ වෙන මොකක්වත් නෙවෙයි, කොටි ත්‍රස්තවාදීන් උතුරේ ලබමින් සිටින පරාජය. ඒ ගොල්ලෝ බලාගෙන හිටියා නැගෙනහිර කොටි පරාජය වුණත් උතුරෙදි සෙල්ලම් පෙන්වයි කියලා. නමුත් ඔවුන්ට අද ජේනවා කොටි ත්‍රස්තයන්ට ආරක්ෂක හමුදා බලය ඉක්මවා යන්න පුළුවන් ශක්තියක්, හැකියාවක් නැති බව. ඒ නිසා මේ බලාපොරොත්තු සුන් කරගත්ත අන්තර්ජාතික බලවේග දැන් බලනවා වෙනත් අලුත් පැත්තකින් ප්‍රශ්නයට ප්‍රවේශම් වෙන්න....මේ අන්තර්ජාතික තලයේ බැට්ල් එකේදී 'අපි වෙනුවෙන් අපි' විතරක් ඉඳලා හරියන්නේ නැහැ. අපි වෙනුවෙන් තව අය ඉන්න ඕන. අපි වෙනුවෙන් මිත්‍ර රටවල් අවදි කරගන්න ඕන. නමුත් ඒකට සාර්ථකව මැදිහත් වෙලා තියෙන බවක් ජේන්නේ නැහැ.''*

මේ තර්කයට අනුව කල්පනා කරතොත් ආධාර දෙන කණ්ඩායමේ සම සභාපතිත්වය දරණ (එක්සත් ජනපදය, යුරෝපා සංගමය, නෝර්වේ සහ ජපානය යන) පාර්ශ්වයන්ගේ අරමුණ වන්නේ දැනට කරගෙන යන යුද ක්‍රියාන්විතයන් කෙසේ හෝ කඩාකප්පල් කර දැමීමය. ඒ නිසා ඊට එරෙහිව 'මිත්‍ර පාක්ෂික රටවල්'වහා නැගිටුවාගත යුතු ය. මේ මිතුරු රටවල් යන්නෙන් බොහෝ විට අදහස් කරන්නේ ආසියාතික රාජ්‍යයන් වන පකිස්ථානය, චීනය, ඉරානය වැනි රටවල (ඇතැම්විට ඉන්දියාවේත්) සහාය ලබා ගැනීම විය හැක. ඇත්තෙන්ම මේ රටවල 'මිතුරුභාවය' ගැන විවාදයක් නැත. විවාදය ඇත්තේ 'සතුරු බලවේග' වශයෙන් නම් කරන රටවල 'සතුරුභාවයේ තරම' පිළිබඳව ය. මේ සතුරන් විස්මයජනක සතුරන් පිරිසකි. ඔවුහු යුද්ධය සඳහා අවශ්‍ය සෑම ආකාරයකම ද්‍රව්‍යමය ආධාර ශ්‍රී ලංකා රජයට සපයති. අවි හා යුද්ධෝපකරණ සැපයීමට අමතරව, ශ්‍රී ලංකා රජයේ හමුදාවන් සමග වාර්ෂික ඒකාබද්ධ යුද අභ්‍යාසවල නියැළෙති. ස්වකීය යුද පාසල් තුළ මෙන්ම ශ්‍රී ලංකාවේ ආරක්ෂක ඇකඩමි

තුළදීද සිය වියදමින් ශ්‍රී ලංකා රජයේ හමුදාවන්ට අවශ්‍ය යුද තාක්ෂණික දැනුම සම්පාදනය කරති. දියුණු යුද තාක්ෂණික පහසුකම් හා සිය ඔත්තු සේවාවන්ගේ ශක්‍යතා ශ්‍රී ලංකා රජය හා බෙදාහදා ගනිති. 'මිතුරන්' වශයෙන් වර්ග කොට ඇති පාර්ශ්වයන් තරමටම ලංකා රාජ්‍යයේ හස්තය ශක්තිමත් කිරීමට ද්‍රව්‍යමය ආධාර සපයන 'සතුරන්'ගෙන්ද ශ්‍රී ලංකා රජයට මදි පාඩුවක් නොමැත්තේ එහෙයිනි. යුරෝපා සංගමයේ සාමාජික රටවල ක්‍රියාකාරීත්වය සහ සිව්වෙනි ඊළම් යුද්ධය අතර ඇති සම්බන්ධය ගැන සාකච්ඡා කිරීම පසුවට තබා (ගියවරද යම් තාක් දුරකට සාකච්ඡා කළ) ඇමරිකා එක්සත් ජනපදයේ භූමිකාව තව දුරටත් විමසා බැලීමෙන් මේ කරුණු සනාථ කරගත හැකිය.

**තහනම් යුද අවි පිළිබඳ ඇත්ත**

ඇත්තෙන්ම සිව්වෙනි ඊළම් යුද්ධය සම්බන්ධයෙන් එක්සත් ජනපදය අනුගමනය කරන සැබෑ පිළිවෙත වඩාත් සූක්ෂම එකකි. ඒ තරමටම නොමග යවන සුළු එකකි. වාචික ස්ථාවර සහ ප්‍රායෝගික පිළිවෙත් අතර බැලූ බැල්මට ඇති පරස්පරය එහි ප්‍රතිඵලයකි. ඇමරිකානු රාජ්‍ය තාන්ත්‍රිකයින් විසින් නිතර පුනරුච්ඡාරණය කරන මානව හිමිකම් පිළිබඳ අවධාරණයන් ගාම්භීර වාං මාලාවකට වැඩිමනත් දෙයක් නොවන බව තේරුම් යන්නේ ශ්‍රී ලංකාව සහ ඇමරිකාව අතර යුදමය තලයේ පවතින ද්‍රව්‍යමය සබඳතා හෙළිදරව් කරගන්නා ප්‍රමාණයටය. සමහරවිට වෙහෙසකර කාර්යයක් වුවද, නොගැඹුරු ප්‍රවෘත්ති වාර්තා සහ උද්වේගකාරී දේශපාලන කතා පසුපස දිව යාමෙන් අනාවරණය නොවන යථාර්ථයන් වටහා ගත හැක්කේ ඒ මගිනි.

ශ්‍රී ලංකාවට සැපයූ ඇමරිකානු යුද ආධාර නැවැත්වීම පිළිබඳ පසුගිය වකවානුවේ පැතිර ගිය ප්‍රවෘත්ති වාර්තා ගෙන බලමු. ඒ සම්බන්ධයෙන් පළවූ ජනමාධ්‍ය වාර්තාවන්ට අනුව දිවයින තුළ පවතින 'අසතුටුදායක මානව හිමිකම් තත්ත්වයන් සැළකිල්ලට ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා රජයට සපයනු ලැබූ යුද ආධාර නැවැත්වීමට' ඇමරිකානු කොංග්‍රස් මඩුල්ල තීරණය කොට තිබේ. 'යුද්ධය නවතාලීමේ බටහිර කුමන්ත්‍රණ' පිළිබඳ දකුණේ පැතිර පවතින පොදුජන විශ්වාසයන් මෙවැනි ප්‍රවෘත්ති වාර්තා මගින් වඩ වඩාත් ශක්තිමත් කරනු ලැබේ. නමුත් සරළ ජනමාධ්‍ය වාර්තාවන්ගෙන් ඔබ්බෙහි ඇති යථාර්ථයන් ගවේෂණයෙහිලා උනන්දු වන්නෝ විරල වෙති. නොගැඹුරු ප්‍රවෘත්ති සහ උද්වේගී ඝෝෂාවන් විසින් යටපත් කෙරෙන සංකීර්ණ යථාර්ථයන් තව දුරටත් සැඟව ඇත්තේ එබැවිනි.

'යුද ආධාර නවතාලීම' පිළිබඳ මේ ප්‍රචලිත පුවත ඇත්තෙන්ම විමසා බැලීමට වටිනා එකකි. එක්සත් ජනපද කොංග්‍රස් මණ්ඩලයේ සාමාජිකයින්ගේ පරිශීලනය පිණිස කොංග්‍රස් පර්යේෂණ සේවාව විසින් මේ වසරේ ජනවාරි මාසයේදී යාවත්කාලීන කොට සම්පාදනය කරන ලද 'ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය අතර සබඳතාවන්ගේ පසුබිම' පිළිබඳ වාර්තාවෙන් අපි ඒ විමසා බැලීම පටන් ගනිමු. අදාළ වාර්තාවට අනුව අත්හිටුවා ඇති මූලික යුද ආධාරක ව්‍යාපෘතිය වන්නේ විදේශ හමුදාවන් සඳහා වන මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමේ වැඩසටහන *(Foreign Military Financing - FMF)* යටතේ කෙරෙන අරමුදල් සැපයීමයි. අදාළ අරමුදල් වනාහී එක්සත් ජනපදයෙන් අවි, යුද උපකරණ හා සේවා මිලදී ගැනීම් සඳහා වැය කිරීමේ කොන්දේසියට යටත්ව ලබාදෙන ණය ප්‍රතිපාදනයන් ය. ඒ අනුව මානව හිමිකම් තත්ත්වයන්ගේ වර්ධනය ගැන ඇමරිකානු රාජ්‍ය ලේකම්වරයා විසින් කොංග්‍රස් මණ්ඩලයට ස්ථිර වශයෙන් සහතික වන තුරු අදාළ වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවට **ආරක්ෂක අපනයන බලපත්‍රද** ***(defence export licenses)***, **යුද උපකරණ හා තාක්ෂණ සැපයුම්ද** අත් හිටුවනු ඇත. නමුත් අදාළ වාර්තාවට අනුවම ආරක්ෂක හමුදාවන්ට අවශ්‍ය ගුවන් සහ නාවුක නිරීක්ෂණ මෙවලම්ද, සන්නිවේදන පහසුකම්ද සැපයීම මේ වර්ගීකරණය යටතට නොගැනේ. *(Sri Lanka: Background and US Relations / Updated 22.01.2008 / CRS report for Congress)*

කරුණු එසේව තිබියදීත්, සිව්වෙනි ඊළම් යුද්ධය ආරම්භ වීමෙන් පසු ගත වූ මුල් දැවුරුද්ද තුළ ඇමරිකාව විසින් ඉහත වැඩසටහන *(FMF)* යටතේම ශ්‍රී ලංකාවට සපයා ඇති ඒකාබද්ධ ප්‍රතිපාදනවල වටිනාකම ඩොලර් මිලියන දෙකකට ආසන්න වේ. දැනට තාවකාලිකව අත්හිටුවනු ලැබ ඇති බව ප්‍රකාශ වුවද 2008 සහ 2009 මුදල් වර්ෂයන් සඳහා එම වැඩසටහන *(FMF)* යටතේ ශ්‍රී ලංකාව සඳහා ඇස්තමේන්තු කොට ඇති ප්‍රතිපාදනවල වටිනාකම ඩොලර් මිලියන 1.32කි. *(US Foreign Aid to East and South Asia: Slected Recipients / Updated 01.05.2008 / CRS report for Congress)*

'කොටි ගළවාගැනීමේ සැළසුම්' කෙසේ වෙතත් එළඹෙන වකවානුව තුළ පවා ලංකාවට පිරිනැමෙන එක්සත් ජනපද යුද ආධාර හකුළා ගැණෙන ස්වභාවයක් කිසිසේත් පෙන්නුම් නොකෙරේ. මේ පිළිබඳ සැක හැර දැනගැනීමට නම් 2008 පෙබරවාරි මාසයේදී එක්සත් ජනපද රාජ්‍ය ලේකම්වරිය විසින් කොන්ග්‍රස් මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද 2009 මුදල් වර්ෂය සඳහා වූ 'විදේශ මෙහෙයුම්' පිළිබඳ අයවැය ඇස්තමේන්තු ලියවිල්ල කියවා බැලීම ප්‍රමාණවත්ය. අදාළ ලියවිල්ලට අනුව ශ්‍රී ලංකාවේ ත්‍රස්ත මර්දන ක්‍රියා සඳහා 2008 වසරේ වෙන්ව ඇති එක්සත් ජනපද ප්‍රතිපාදනය ඩොලර් 2,656,000කි. 2009දී එය 2,900,000ක් දක්වා වැඩි කිරීමට අපේක්ෂා කෙරේ. ස්ථායීකරණ මෙහෙයුම් සහ ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා 2008දී වෙන් කළ මුදල ඩොලර් 1,013,000කි. 2009දී එය ඩොලර් 1,850,000ක් තෙක් වැඩිවීමට නියමිතය. අන්තර්ජාතික යුදමය අධ්‍යාපන සහ පුහුණුකිරීමේ වැඩසටහන *(International Military Education & Training - IMET)* සඳහා 2008දී ඩොලර් 571,000ක් වෙන්ව තිබේ. 2009දී එය ඩොලර් 600,000තෙක් වැඩි කෙරෙනු ඇත. *(Congressional Budget Justification - Foreign Operations / Fiscal Year 2009/* ***591-594*** *පිටු)*

**අපි වෙනුවෙන් 'අන්කල් සෑම්'**

මේ අනුව බලතොත් 'අපි වෙනුවෙන් අපි' හැර තවත් බොහෝ ආකර්ශණීය පිරිස් රොක්වන බවට දැනටමත් පැහැදිලිව තිබේ. සිව්වෙනි ඊළම් යුද්ධයට අදාළ ඇමරිකානු පිළිවෙත ඇත්ත වශයෙන්ම අන්තර්ගතව ඇත්තේ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ සහ පෙන්ටගනයේ ලිපි ලේඛණ සහ වාර්තා තුළ ය. අපි නිදසුනක් වශයෙන් ''**655 වාර්තාව**'' *(Section 655 Report)* නමින් හැඳින්වෙන ලේඛණය විමසා බලමු. 'විදේශ ආධාරක පනතේ'' *(Foreign Assistance Act)* අංක 655 කොටසට යටත්ව සකසනු ලබන නිසා ''**655 වාර්තාව**'' නමින් හඳුන්වනු ලබන මෙම ලේඛණය සකස් කිරීමේ වගකීම හවුලේ පැවරී ඇත්තේ ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවට සහ ආරක්ෂක දෙපාර්තමේන්තුවට ය. ඇමරිකාව විසින් වාර්ෂිකව නිශ්චිත වශයෙන් සපයනු ලබන යුද උපකරණ සහ ආධාරක සේවාද, යුදමය අපනයන සහ ආනයනයන්ද පිළිබඳ නිල හා සවිස්තරාත්මක දත්ත ඇතුළත් කොට අදාළ දෙපාර්තමේන්තු දෙක විසින් මෙම වාර්තාව වෙන් වෙන්ව සකසනු ලබයි. එමගින් ආවරණය කරන දත්ත අතරට සෘජු වාණිජ විකුණුම්ද *(Direct Commercial Sales)*, අන්තර්ජාතික යුදමය අධ්‍යාපන සහ පුහුණුකිරීමේ වැඩසටහන්ද *(IMET)*, අතිරික්ත ආරක්ෂණ උපකරණ *(Excess Defense Articles)* සහ විදේශයන් සඳහා වන යුදමය විකිණුම්ද *(Foreign Military Sales)* පිළිබඳ පූර්ණ

දත්ත ඇතුළත් වේ. මෙයින් රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාව මහජන අනුදැනුම පිණිස ප්‍රසිද්ධියට පත්කරනු ලැබුණද, ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාවේ අඩංගු දත්ත රහස්‍ය ගණයේ ලා සැළකේ. මහජනයා වෙනුවෙන් අනාවරණය කෙරෙනුයේ එයින් තෝරාගත් කොටස් කිහිපයක් පමණි.

2007 මුදල් වර්ෂය සඳහා වූ 655 වාර්තාව නිකුත් කරන ලද්දේ 2008 ජූලි මාසයේදී ය. 2006 ඔක්තෝබර් 01 වෙනිදා සිට 2007 සැප්තැම්බර් 30 දක්වා වූ කාල සීමාව ආවරණය වන පරිදි නිකුත් කළ මෙම වාර්තාව මගින් හෙළිකෙරෙන ආකාරයට එම කාල සීමාව තුළ එක්සත් ජනපදය විසින් ශ්‍රී ලංකාවට අපනයනය කිරීමට අනුමැතිය දෙන ලද යුද්ධෝපකරණ, අවි ආයුධ සහ අමතර කොටස්වල සමස්ත වටිනාකම ඩොලර් 21,183,501කි *(Direct Commercial Sales Export Authorization for Fiscal Year 2007/* ***180 සහ 181 පිටු)***. එම කාල සීමාව තුළදීම අන්තර්ජාතික යුදමය අධ්‍යාපන සහ පුහුණුකිරීමේ වැඩසටහන *(IMET)* යටතේ ශ්‍රී ලංකාව වෙනුවෙන් වැයකොට ඇති ප්‍රතිපාදනවල වටිනාකම ඩොලර් 4,83,000කි.

මීට අමතරව පෙන්ටගනය සහ රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඇමරිකානු හමුදා පාසල් තුළ මෙන්ම ඒ ඒ රටවල ජාතික ආරක්ෂක ආයතන හා ඇකඩමි තුළද මෙහෙයවනු ලබන වැඩසටහන් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් 'විදේශ හමුදාමය පුහුණුවීම්' පිළිබඳ වාර්ෂික වාර්තාව තවත් කදිම නිදසුනකි. වෙළුම් තුනකින් නිකුත් කෙරෙන මෙම වාර්තාවේ වෙළුම් දෙකක්ම රහස්‍ය ලේඛණ ගණයට වැටේ. 2006 මුදල් වර්ෂය ආවරණය වන පරිදි 2007 අගෝස්තු මාසයේදී නිකුත් කරන ලද මෙම වාර්තාවට අනුව ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක අංශ සාමාජිකයින් 307 දෙනෙකුට අවශ්‍ය පුහුණු කටයුතු සඳහා ඩොලර් 1,426,236ක මුදල් එක්සත් ජනපදය වැය කොට තිබේ. *(Foreign Military Training: Joint Report to Congress, Fiscal Years 2006 and 2007 , Volume I /* ***82-90 පිටු)*** උතුරු කැරොලිනාවේ ෆෝට් බ්‍රැග්හී ජෝන් එෆ්. කෙනඩි විශේෂ යුද ක්‍රියා පාසලේද, ඇරිසෝනා ප්‍රාන්තයේ එක්සත් ජනපද හමුදා බුද්ධි අංශ මධ්‍යස්ථානයේද, ටෙක්සාස්හි ෂෙපර්ඩ් ගුවන් හමුදා කඳවුරේද, කැන්සාස් ප්‍රාන්තයේ ෆෝට් ලෙවන්වර්ත්හි එක්සත් ජනපද හමුදා ආඥා සහ මාණ්ඩලික සේවා විදුහලේද, ඇලබාමාහි මැක්ස්වෙල් ගුවන් හමුදා කඳවුරේ ගුවන් ආඥා පාසලේද, ජෝර්ජියා ප්‍රාන්තයේ ෆෝට් බෙනින්ග්හි එක්සත් ජනපද හමුදාවන්ගේ ඇමරිකානු යුද පාසලේද, රෝඩ්ස් දිවයිනේ නිව් පොර්ට්හි නාවුක යුද විදුහලේද, වර්ජිනියා ප්‍රාන්තයේ නෝර්ෆෝක්හි ඒකාබද්ධ හමුදා මාණ්ඩලික පාසලේද, වොෂින්ටන් නුවර උපායික අධ්‍යයනය සඳහා වූ මෑත පෙරදිග දකුණු ආසියාතික මධ්‍යස්ථානයේද, හවායි හි ආරක්ෂණ අධ්‍යයන කටයුතු පිළිබඳ ආසියා පැසිෆික් කේන්ද්‍රයේද ඇතුළු තවත් බොහෝ ස්ථානවලදී ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා සාමාජිකයින්ට එක්සත් ජනපද යුද උපදේශනය තව දුරටත් සැපයේ.

'මිතුරු-සතුරු' කඳවුරු පිළිබඳ සරළ සමීකරණවලට ඉඩ ලැබී ඇත්තේ ඉහතින් පෙන්වා දී ඇති දත්තමය යථාර්ථයන් දකුණේ බොහෝ දෙනා නොදන්නා බැවිනි. ඇත්ත නම්, පකිස්ථානය තරමටම ඉන්දියාවත්, ඉන්දියාව තරමටම චීනයත්, ඊශ්‍රායලය තරමටම ඉරානයත්, ඉරානය තරමටම එක්සත් ජනපදයත් ඊළමට එරෙහි යුද්ධයේ ගෝලීය හවුල්කරුවන් බවට පත්ව ඇති බවය. බැලූ බැල්මටම පෙනෙන්නේ පෙරදිග 'මිතුරන්ගේ' අවි ආයුධත්, බටහිර 'සතුරන්ගේ' යුද ඥාණයත් දෙමළ ගරිල්ලා බලය තලා දමන්නට එක හා සමාන උපයෝගීතාවකින් යොදාගත හැකි බැව් ශ්‍රී ලංකා රජය වටහාගෙන ඇති බවකි. මේ විමසුමෙන් තවමත් මඟහැරී ඇති යුරෝපා හවුල පිළිබඳ යථාර්ථයන්ද නිසි ලෙස අනාවරණය කරගත් පසු දකින්නට ලැබෙනු ඇත්තේ බටහිර කුමන්ත්‍රණකරුවන්ගේ මහසෝන් රුව නොව, ඊළමට එරෙහි ගෝලීය සන්ධානයේ පරිපූර්ණ චිත්‍රයයි.

**(මතු සම්බන්ධයි)**

**රවීස**

*raveesa@googlemail.com*

*රාවය / 2008 ඔක්තෝබර් 05*